# **<u>05 ශ්‍රේණි ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 06 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම.</u>**

පාසල්වල හය ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම “2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා සිසුන් ඇතුලත් කිරීම” පිළිබඳ 2008.09.19 දිනැති, අංක 2008/37 දරණ චක්‍රලේඛයේ 4.0 වගන්තිය හා එහි සංශෝධිත 2018.02.16 දිනැති, අංක 2018/3 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය සහ අංක ED/01/12/15/02/04 හා 2018.12.19 දිනැති උපදෙස් ලිපියෙහි උපදෙස් ප්‍රකාරව සිදුකරනු ලැබේ.

ඒ අනුව හය ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා පහ ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගනු ලැබේ. පාසල්වල පවතින පුරප්පාඩු සංඛ්‍යාව,පාසල් ඉල්ලුම් කර ඇති සිසුන්ගේ ලකුණු මට්ටම හා සිසුන් සංඛ්‍යාව අනුව පාසල්වල කඩඉම් ලකුණු තීරණය වේ. මෙය පාසලෙන් පාසලට වෙනස් වේ.

ප්‍රධාන පාසල්වල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශිෂ්‍යත්වධාරීන් විසින් ඉල්ලුම් කරනු ලබන පාසල්වලට මෙම අමාත්‍යාංශය මඟින් සිසුන් යොමු කරනු ලැබේ.

ශිෂ්‍යත්වධාරීන්ට අතිරේකව,

1. ප්‍රාථමික අංශයක් සහිත පාසල්වල හය ශ්‍රේණියට එම පාසලේ ප්‍රාථමික අංශයේ සිසුන් ශිෂ්‍යත්ව ලකුණු නොසලකා ඇතුළත් කරනු ලබයි.
2. යම් පාසලකට පෝෂිත පාසල් අනුබද්ධ කර ඇත්නම් එම පෝෂිත පාසල්වල සිසුන් හය ශ්‍රේණියට ඇතුළත් කරනු ලබයි.

<u>6 ශ්‍රේණියෙන් ආරම්භවන පාසල් සඳහා සිසුන් ඇතුළත් කිරීම</u>

3/2018 චක්‍රලේඛයට අනුව ප්‍රාථමික අංශයක් හෝ අනුබද්ධ පෝෂිත පාසල් නොමැති කල්හි, 6 ශ්‍රේණියෙන් ආරම්භ වන පාසල්වලට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කිරීමේදී මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 85%ක් ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු මත ද ඉතිරි 15% කඩඉම් ලකුණු ඉක්මවනු ලබන ආදිශිෂ්‍ය, සහෝදර, හා අධ්‍යයන කාර්ය මණ්ඩල යන ගණවලට අයත් සිසුන්ගෙන්ද සම්පූර්ණ කරනු ලබයි. එම 15% සඳහා විදුහල මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ සිදු කර ඉහලම ලකුණු ලැබූ ශිෂ්‍ය නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර අනුමැතිය ලබාගනී.